# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු/ සැප්තැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය (නව/පැරණි නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට 1597 දක්වා HIST – E 2015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රාථමික මූලාශ්‍රය පිළිබඳව අනුරාධපුර යුගයට විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

02. "ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාසකරණය ක්‍රමිකව සිදුවූවකි." ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් විමසන්න.

03. ශ්‍රී ලංකාවේ ඒකච්ඡත්‍ර රාජ්‍යයක් බිහිකිරීම උදෙසා පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස සහ දුටුගැමුණු රජුගේ දායකත්වය ප්‍රමාණ කරන්න.

04. අනුරාධපුර යුගයේ මෙරටට එල්ල වූ ප්‍රධාන දකුණු ඉන්දීය ආක්‍රමණ කවරේදැ' යි පරීක්ෂා කරන්න.

05. "ලෝක-සාසන" සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ පාලකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග අනුරාධපුර සහ පොළොන්නරු යුග ඇසුරින් පැහැදිලි කරන්න.

06. කාලිංග මාඝගේ ආක්‍රමණයේ ස්වභාවය සැකෙවින් දක්වා එයින් බුද්ධ ශාසනයට ඇති වූ බලපෑම විස්තර කරන්න.

07. "තුන්වන විජයබාහු රජතුමා ගොඩනැගූ දේශපාලන ස්ථාවරත්වය ශ්‍රී ලංකාවේ මධ්‍යතන යුගයේ ඉතිහාසයෙහි විශේෂ වැදගත්කමක් දරයි." සාකච්ඡා කරන්න.

08. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ කාර්ය සාඵල්‍යය ප්‍රමාණ කරන්න.

09. ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනැගීම සඳහා හයවන පරක්‍රමබාහු රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

10. 'විජයබා කොල්ලය' කෝට්ටේ රාජ්‍යයේ පිරිහීමට බලපෑ ආකාරය විමසන්න.

****************************